**#mediaethicsSL #EnglishPress #lka #SundayDivaina #May13**

දිවයින පුවත්පත මගින් ද්‍රවිඩ ජාතික සන්ධානයේ සුමන්දිරන් මන්ත්‍රීවරයා විසින් උතුරු නැගෙනහිර පන්සල් තැනීම තහනම් කරන මෙන් ඉල්ලා සිටි බවට දිවයින පුවත්පත පසුගිය සතියේ දක්වා තිබූ අතර, එම ප්‍රවෘත්තිය මගින් කරුණු විකෘති කොට ඇති බවට නිල නිවේදනයක් ද්‍රවිඩ ජාතික සන්ධානය මගින් නිකුත් කොට තිබිණි. එය දිවයින පුවත්පත වෙතද දන්වා ඇති බව එම නිවේදනයේ සඳහන් වූවත්, අද වනතුරුද දිවයින පුවත්පතක ඒ සම්බන්ධ නිවැරදි කිරීමක් පළ වී නොතිබුණි.

එම නිල නිවේදනය පළ වීමෙන් අනතුරුවද දිවයින ලිපියක් හරහා ප්‍රකාශ වන්නේ 'උතුරේ පන්සල්/බුදු පිළිම සෑදීමට ඉඩ නොදෙන බව සුමන්දිරන් මීට දින කිහිපයකට පෙර පැහැදිලිව කියූ' බවයි! මෙහිදී පාඨකයින් හට මුහුණ දීමට සිදුවන ගැටළුව වන්නේ සැබෑ ප්‍රවෘත්තිය, සත්‍යය කුමක්ද යන්නයි. ද්‍රවිඩ සන්ධානයේ නිවේදනය සැබෑ වේ නම් දිවයින පුවත්පත එක් වරක් නොව දෙවරක්ම මාධ්‍ය ආචාර ධර්මයන් උල්ලංඝනය කොට ඇත. යම් හෙයකින් ද්‍රවිඩ සන්ධානයේ නිවේදනය සාවද්‍ය වේ නම්, පුවත්පතක් ලෙසින් දිවයින කළ යුතුව තිබුණේ, එම නිල නිවේදනය සාවද්‍ය බවට කරුණු ගෙන හැර දැක්වීමයි. එය "නිල" නිවේදනයක් බව අමතක කළ යුතු නොවේ.

පුවත්පතක් සෑම විටම විනිවිද භාවයකින් යුතුව සත්‍යය හෙළිදරව් කරනු විනා, සිය පාඨකයින්ව මෙවැනි තැනකට පත් නොකළ යුතු බව අපගේ හැඟීමයි.